සාමාන්‍ය සමය විසිතුන්වන ඉරුදින **දේව ප්‍රකාශන** 09-09-12

## පළමුවන කියැවීම

ඉසයියස් 35:4-7

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"දෙවිඳුණෝ වඩින කල බිහිරන්ගේ කන් ඇරෙන්නේ ය. ගොළු අය ප්‍රීතියෙන් ගී ගයන්නෝ ය."**

බියසුලු සිත් ඇත්තන්ට මෙසේ කියන්න. "භය නොවී දිරි ගන්න. දෙවිඳුණෝ ඔබ මුදන පිණිසත්, ඔබේ සතුරන්ගෙන් පළිගන්න පිණිසත් වඩින සේක." අන්ධයන්ගේ ඇස් පැහැදෙන්නේ ය. බිහිරන්ගේ කන් ඇරෙන්නේ ය. කොර අය මුවන් මෙන් දුව පනින්නෝ ය. ගොළු අය ප්‍රීතියෙන් ගී ගයන්නෝ ය. කාන්තාරයෙන් ජලධාරා ගලා එන්නේ ය. මරුකතරෙන් ඇළ දොළවල් බිඳී එන්නේ ය. මිරිඟුව ජල පොකුණක් වෙයි. වියළි බිම උල්පත් වලින් පිරෙයි. සිවළුන් ලැගුම් ගත් පාළු පෙදෙස්වල බට පඳුරු හා පන් ගස් හට ගන්නේ ය."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීයය

ගීතාවලිය 146:7-10

පිළිතුර: මාගේ සිත සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

ගීය: සමිඳුණෝ සදාකල්ම විශ්වාසීව සිටින සේක. එතුමාණෝ පීඩා විඳින්නන්ට යුක්තිය ඉටු කර දෙන සේක. සාගිනි වූවන්ට ආහාර දෙන සේක.

එතුමාණෝ සිරකරුවන් මුදන සේක. අන්ධයන්ගේ ඇස් පහදන සේක. වැටී ගියවුන් නඟා සිටුවන සේක. සමිඳුණෝ දැහැමියන්ට ප්‍රේම කරන සේක. විදේශීන් ආරක්ෂා කරන සේක. අනාථයන්ට හා වැන්දඹුවන්ට උපකාර කරන සේක.

එහෙත්, දුදනාගේ යෝජනා සුන් කරන සේක. සමිඳුණෝ සදහට ම රජකම් කරන සේක. එම්බා සියොන් නගරය! ඔබේ සමිඳුණෝ සියලු පරම්පරා දක්වා රජකම් කරන සේක. සමිඳුන්ට ප්‍රශංසා වේවා!

## දෙවන කියැවීම

ජාකොබ් 2:1-5

ශුද්ධ වූ ජාකොබ් තුමාගේ හසුනෙන් ගත් කොටසකි.

**" දේව රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිස උන් වහන්සේ දිළිඳුන් තෝරා ගත් සේක."**

මාගේ සහෝදරයෙනි, ඔබ තේජශ්‍රීයෙන් වැජඹෙන, අපගේ ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහන නිසා, මිනිසුන්ගේ තරාතිරම් බැලීමෙන් වැළකෙන්න. රන් මුදු පැළඳ, ඉස්තරම් වස්ත්‍ර ඇඳගත් කෙනෙක් ද වැරහැලි ඇඳගත් දිළින්දෙක් ද ඔබගේ ධර්ම ශාලාවට පැමිණියෝ යයි සිතමු. ඔබ ඉස්තරම් වස්ත්‍ර ඇඳගත් අයට විශේෂ සැලකිලි දක්වා, "කරුණාකර මෙහි අසුන් ගන්න." කියා ද, දිළින්දට "උඹ ඔතන

හිටපන්" නැත්නම් "මාගේ පා පුටුව ළඟ බිම හිඳගන්නැ"යි කියා ද කීවොත් ඔබ පැත්ත අදින, අයුතු මිම්මෙන් මනින, තරාතිරම් බලන අය නොවෙන්නහු ද? මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, සවන් දෙන්න, ඇදහිල්ලෙහි ධනවතුන් වන පිණිසත්, දෙවියන් වහන්සේට ප්‍රේම කරන්නන් හට පොරොන්දු වූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, උන් වහන්සේ ලෝකයේ දිළිඳුන් තෝරා ගත්තේ කුමක්නිසා ද?

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

<u>සාධුකාරය</u> ජුවාම් 1:14,12

ආලේලූයා! ආලේලූයා!
සමිඳුණෙනි, කථා කළ මැනව. ඔබ වහන්සේගේ මෙහෙකරුවා සවන් දී සිටී.
සදතන ජීවනයේ වචන ඇත්තේ ඔබ වහන්සේ වෙතය.
ආලේලූයා!

<u>ශුද්ධවූ සුවිශේෂය</u> මාක් 7:31-37

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**" ජේසුස් වහන්සේ බිහිරන්ට ඇසීම ද ගොළුවන්ට බිණීම ද පවා සලසා දෙන සේක."**

යළිත් උන් වහන්සේ තීර් පෙදෙසින් පිටත් ව, සීදෝනය මැදින් ගොස්, දෙකපොලිස පෙදෙස පසු කොට ගලීල මුහුද ළඟට පැමිණි සේක. එකල සෙනඟ වික්කල් බිහිරෙකු උන් වහන්සේ වෙත ගෙනවුත් ඔහු පිට අත තබන ලෙස උන් වහන්සේගෙන් උදක්ම ඉල්ලූ හ. උන් වහන්සේ ඔහු සමූහයා කෙරෙන් වෙන් කොට ඉවතට ගෙන ගොස්, ඔහුගේ කන්වල උන් වහන්සේගේ ඇඟිලි බහා, තමන් කෙළ වලින් ඔහුගේ දිව ස්පර්ශ කළ සේක. ඉන්පසු ස්වර්ගය දෙස බලා, සුසුම් ලා, "එප්පාතා"යි ඔහුට වදාළ සේක. එහි අර්ථය, 'ඇරේවා' යනු යි. එවිට ඔහුගේ කන් ඇරී, දිවේ බැඳුම ලිහී, ඔහු පැහැදිලි ලෙස කතා කෙළේ ය. ඒ බව කිසිවෙකුට නොකියන්න උන් වහන්සේ ඔවුන්ට අණ දුන් සේක. එහෙත්, උන්වහන්සේ එය යම් පමණ තහනම් කළ සේක් ද, ඔව්හු එපමණටත් වඩා එය පතළ කළහ. එය ඇසුවෝ අතිශයින් මවිත ව, "උන් වහන්සේ හැම දෙය ම යස ලෙස කරන සේක; බිහිරන්ට ඇසීම ද ගොළුවන්ට බිණීම ද පවා සලසා දෙන සේකැ"යි කී හ.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.